**දිඹුලාගල ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

*මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.*

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව රු.304,212 ක් වූ උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර්, දෙසැම්බර් මාසවලට අදාළ රු.278,333 ක උසාවි දඩ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් රු.3,266,000 ක් වටිනා අයිතම 06 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයේ විද්‍යුත් පුස්තකාල සඳහා ලැබුණු භාණ්ඩ වලින් 2023 වර්ෂයේ ආපසු භාරදෙන ලද රු.1,351,368 ක් වටිනා භාණ්ඩ සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් තුළ ඇතුළත් වීමෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාස වලට අදාළ රු.678,600 ක වැලි කැණීම් ආදායම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් විෂයයන් 05 කට අදාළ වටිනාකම්, ඊට අදාළ උපයෝගී ලේඛන වල දැක්වෙන වටිනාකම් සමඟ රු.1,063,003 කින් නොසැසඳුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශේෂ අතර වෙනසට හේතුව හඳුනාගැනීමෙන් අනතුරුව නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| ජල තැන්පත් | 76,200 | යාවත්කාලීන කරන ලද තැන්පතු ලේඛනය | විධිමත් කරගැනීමට කටයුතු කරන බව | තැන්පත් ලේඛනය යාවත්කාලීන කළ යුතුය. |
| විවිධ තැන්පත් | (955,532) | උපලේඛනය | | උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| සමුච්චිත ක්ෂය | 86,002,724 | ක්ෂය විශ්ලේෂණය | | විශ්ලේෂණ ඉදිරිපත් කළ යුතුය. |
| ස්ථාවර තැන්පතු පොලී ආදායම | 2,388,029 | පොලී ගණනයට අදාළ උපලේඛනය ස්ථාවර තැන්පතු අලුත් කිරීමේ දැන්වීම | විධිමත් කරගැනීමට කටයුතු කරන බව | උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| ස්ථාවර තැන්පතු වටිනාකම | 18,998,903 | ශේෂ සනාථ කිරීමේ ලිපි | | |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රීති හා ප්‍රඥප්ති විධිවිධාන | | | |
| (i) | 2018අගෝස්තු 29 දින අංක 2086/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා සඳහා ප්‍රකාශිත රීති අංක 1.1 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් සංයුක්ත ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකුට මාසිකව ඉන්ධන ලීටර් 400ක් හිමිවන නමුත් වැඩබලන සභාපතිවරයාට ලබාදී තිබූ PF- 7441දරන වාහනය සඳහා නියමිත සීමාව ඉක්මවා රු 11,250.ක් වටිනා ඉන්ධන ලීටර් 25 ක් භාවිතා කර තිබුණු අතර, මීට අමතරව 252-6532 දරන කැබ් රථය හා LL 7627-දරන කෘෂ කැබ් රථයද භාවිතා කර ඒ සඳහා රු.119,026 ක් වටිනා ඉන්ධන වැය කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්මවූ වියදම රු.17,722,076 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයභාරය රු.11,965,451 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,171,480 | 3,046,655 | 2,320,180 | 693,220 | 41,250,000 | 2,254,865 | 1,794,100 | 2,667,500 |
| කුලී | 5,646,565 | 4,533,785 | 3,012,217 | 3,817,385 | 6,513,827 | 3,162,964 | 2,671,906 | 5,070,828 |
| බලපත්‍ර ගාස්තු | 1,167,250 | 585,210 | 271,000 | 1,796,155 | 16,539,750 | 315,000 | 258,000 | 162,000 |
| වෙනත් ආදායම් | 109,990,296 | 85,991,168 | 95,445,945 | 59,832,574 | 13,300,000 | 68,394,491 | 32,453,304 | 76,499,798 |
| එකතුව | 118,975,591 | 94,156,818 | 101,049,342 | 66,139,334 | 77,603,577 | 74,127,320 | 37,177,310 | 84,400,126 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ආදායම රු.941,729 ක් වූ අතර, හිඟ සතිපොළ බදු ආදායම රු.2,369,614 ක් විය. | හිඟ කුලී ආදායම අයකිරීමට කටයුතු කරන අතර, දීර්ඝ කාලයක් හිඟව පවතින ශේෂ සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **බලපත්‍ර ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,421,875 ක හිඟ වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු ආදායමක් පැවතුණි. | හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ඈ) වෙනත් ආදායම්**<br>ඉදිරිපත් කළ වාර්තා අනුව ජල ව්‍යාපෘති 04 ට අදාළව 2023 වර්ෂය තුළ රැස්කළ යුතු ආදායම රු.68,431,230 ක් වූ අතර, 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තුව රු.20,234,226 ක් විය. මේ අනුව ආදායමෙන් සියයට 29 ක ප්‍රතිශතයක් හිඟ ආදායම් ලෙස පැවතුණි. | හිඟ ජලගාස්තු ආදායම අඩුකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>**<br>ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ සතිපොළ බදු, ත්‍රී රෝද රථ ගාස්තු හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් යන කාරණා 03 වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අවශ්‍ය කටයුතු කරන බව දන්වා ඇත. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>**<br>සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 36 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කිසිඳු ක්‍රියාකාරකමක් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි. | ක්‍රියාකාරකම්වලින් කොටසක් ඉටුකිරීමට කටයුතු කළ බව දන්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කළ යුතුය. |
| **(ඇ) <u>අත්හැර දැමූ කතර්ව්‍යයන්</u>**<br>සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන් වලදී සංවර්ධන ව්‍යාපෘති 14 ක් ආරම්භ කර ඒ සඳහා රු.24,044,236 ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගෙන අත්හැර දමා තිබුණි. | අවශ්‍ය කටයුතු අකරන බව දන්වා ඇත. | අපේක්ෂිත ප්‍රතිඵල අත්කරගත යුතුය. |

## 3.2 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර පාසල හා දිවාසුරැකුම් මධ්‍යස්ථානයේ සෙල්ලම් මිදුල සඳහා අවශ්‍ය උපකරණ හා ළදරු මේස හා පුටු මිලටගැනීමට අදාළ ලංසු ඇගයීම් වාර්තාවට අනුව සියලු ලංසුකරුවන් කිසිදු අඩුපාඩුවකින් තොරව ලංසු ලේඛන ඉදිරිපත් කර සියලු කොන්දේසිද සපුරා තිබුණද, අවම මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනය තෝරා නොගෙන ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා වැඩි වටිනාකමකින් යුතු මිලගණන් ඉදිරිපත් කළ ආයතනයක් තෝරාගැනීමට හේතුන් සහ අනෙක් ලංසුකරුවන් ප්‍රතික්ෂේප කිරීමට හේතු සඳහන් නොකර අවම මිළට වඩා රු.1,601,580 ක් වැඩිපුර වැය කර තිබුණි. | සැපයුම්කරුවන් 10 දෙනෙකුගෙන් මිලගණන් කැඳවීමට කටයුතු කරන ලද බව දන්වා ඇත.<br>අවම මිළ ඉදිරිපත් කළ ආයතනය ඉදරිපත් කරන ලද අයිතමවලින් සමස්ත අයිතම ප්‍රමාණයම නිරුපණය නොකළ අතර තෝරාගත් ආයතනය විසින් සියළුම අයිතම සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.<br>තවද උපකරණ ලබාදීමේදී පළපුරුද්ද හා ගුණත්වය පිළිබඳ සහතික අවම මිළ ඉදිරිපත් කළ ආයතනයට සාපේක්ෂව තෝරාගත් සැපයුම්කාර ඇති හෙයින්, ප්‍රශස්ථ ලංසුකරු වන Lalans Sports Goods ආයතනය වෙත ලංසුව ප්‍රධානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලද බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ -යන්ට පටහැනිව කටයුතු නොකළ යුතුය. |
| (ආ) | CDLG ව්‍යාපෘතිය යටතේ කාන්තා මන්ත්‍රීවරියන් සවිබල ගැන්වීම සඳහා ලද රු.500,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර අඩු ආදායම් ලාභී පවුල් 25 ක් වෙත අවශ්‍ය රු.485,650 ක් වටිනා උපකරණ බෙදා දී තිබුණි. ප්‍රතිලාභීන් 05 දෙනෙකු හට ලබා දුන් රු.97,125 ක් වටිනා භාණ්ඩ නිෂ්කාර්යව නිවෙස්වල ගබඩා කර තිබුණු අතර, ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් කරන අයෙකු වෙත ආහාර නිෂ්පාදන උපකරණ ලබාදුන් අවස්ථාවක්ද විය. | නිෂ්කාර්යව පවතින භාණ්ඩ භාවිතයට ගන්නා ලෙස අදාළ පාර්ශවයන් ලිඛිතව මෙන්ද, වාචිකවද දැනුවත් කරන ලද බව දන්වා ඇත. | ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන් නිවැරදිව හඳුනාගෙන භාණ්ඩ බෙදාදීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිඹුලාගල ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර වලට අදාළව පුද්ගලයන් 21 දෙනෙකුගෙන් අයවිය යුතුව පවතින හිඟ කඩකුලී ආදායම රු.559,590 ක් වූ නමුත්, | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම අය කරගැනීමට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සභාවේ ලිපිගොනු වල පවතින අඩුපාඩු හේතුවෙන් පුද්ගලයන් 06 දෙනෙකුට අදාළ රු.166,170 ක හිඟ ආදායමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වී තිබුණු බැවින් වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල් අයකරගත යුතුව පැවතුණි. | | |
| (ආ) | මනම්පිටිය අංක 09 කඩ කාමරය 2018 - 2020 වර්ෂවලදී බදු දී, ඊට අදාළ හිඟ මුදල රු.76,680 ක් ගිවිසුම් අඩුපාඩු හේතුවෙන් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාව අපොහොසත් වී තිබුණු අතර, වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ බව දන්වා ඇත. | හිඟ ආදායම් සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ගගත යුතුය. |
| (ඇ) | සති පොලවල් වලට අදාළව රු.953,250 ක හිඟයක් ගිවිසුම් නොමැති වීම හා බදු කරුවන්ගේ තොරතුරු සභාව සතුව නොපැවතීම හේතුවෙන් අයකරගත නොහැකි තත්ත්වයක් පැවති අතර, නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත හැකිව තිබූ රු.1,644,495 ක හිඟය ද අයකර ගැනීම සඳහා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ගිවිසුම් නොමැති බදුකරුවන් හැර අනෙකුත් බදුකරුවන්ගෙන් හිඟ සතිපොළ ගාස්තු අයකරගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ගගත යුතුය. |
| (ඈ) | නුවරගල හා සිරිපුර ජල ව්‍යාපෘති වල ජලය පිරිපහදු වන පිල්ටර් වල වැලි ප්‍රමාණය පැවතිය යුතු මට්ටමට වඩා ඉතා පහළ මට්ටමක පැවතියද, පිල්ටර් සඳහා වැලි යෙදීමක් සිදුනොවීම තුළ පිල්ටරයේ ඇති ගල් තට්ටුව තුළ මඩ තැන්පත් වීමක් සිදුවීමේ අවදානමක් හා ඒ අනුව සම්පූර්ණ පිල්ටරයටම හානි වීමක් සිදුවීමේ අවදානමක් පැවතුණි. | අවශ්‍ය කටයුතු මේ වනවිට කරමින් පවතින බව දන්වා ඇත. | ජල ව්‍යාපෘති නිසි පරිදි නඩත්තු කළ යුතුය. |
| (ඉ) | 2023 අප්‍රේල් 20 දිනැති DIM/2023/14/20/66 කමිටු තීරණය අනුව පිරිපහදු කරන ලද වැලි මිලදීගැනීමට තීරණය කර තිබූ නමුත්, එම තීරණය යටතේ වැලි මිලදීගැනීමට අදාළ කිසිඳු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන කටයුතු කර ඇති බව දන්වා ඇත. | ජල ව්‍යාපෘති නිසි පරිදි නඩත්තු කළ යුතුය. |
| (ඊ) | ජල ව්‍යාපෘති 04 මඟින් ජල සම්බන්ධතා 6,789 ක් ලබාදී තිබුණු අතර, ඒවාට සවිකර තිබූ මනු 1,124 ක් එනම් සියයට 16 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | ඉතිරි ජල මනු මිලදීගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | අවශ්‍ය ජල මනු සවිකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ස්ථාවර වත්කම් ලේඛනයේ හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.225,875 ක් හා රු.431,175 ක් වටිනා වත්කම් දෙකකට අදාළව වත්කම කුමක්ද යන්න හඳුනාගැනීමකින් තොරව වටිනාකම පමණක් ඇතුළත් කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2019, 2020, 2021 වර්ෂවලදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 76 කට අදාළව රු.1,626,116 ක අත්තිකාරම් මුදලක් ලබාදී ඇතත්, ව්‍යාපෘති කටයුතු ඉටුකර නොමැති අතර, අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කරන බව දන්වා ඇත. | අත්තිකාරම් අයකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |
| (එ) | 2015 පෙබරවාරි 20 දින මිලටගෙන සභාවේ වත්කම් වශයෙන් ඉන්වෙන්ට්‍රි ලේඛනගත කළ ඩෙල් වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05 ක් හා IPAD යන්ත්‍ර 02 ක් හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හත් දෙනෙකු වෙත නිකුත් කර වසර 08 කට අධික කාලයක් ගතව ඇතත් ආපසු සභාව වෙත ලබාගෙන නොතිබුණු අතර, ලැප්ටොප් යන්ත්‍ර 05 ක් හා IPAD යන්ත්‍රයක් ආපසු භාරදීමට නොහැකි මන්ත්‍රීවරුන් 06 දෙනෙකු විසින් ඊට අදාළ වටිනාකම 2019 ජූනි 26 දින සිට වාරික 30 කින් ගෙවීමට එකඟතාව පළකර තිබූ නමුත් එම ගෙවීමද පැහැර හැර තිබුණු බැවින් සභාවට රු.722,999 ක පාඩුවක් සිදුවී තිබුණි. | අදාළ වටිනාකම සභාව වෙත පියවන ලෙස ලිඛිතව දැනුවත් කරන ලද බව දන්වා ඇත. | ගිණුම් කාරක සභා නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2014 දෙසැම්බර් 16 දින සභාවට ලබාදී තිබූ ගැල්වනයිස් කොඩිකණු 360 ක් හිටපු සභාපතිවරයා හා මන්ත්‍රීවරුන් 05 දෙනෙකු වෙත නිකුත් කර වසර 09 කට අධික කාලයක් ගතව ඇතත් ඒවා සභාව වෙත ලබාගෙන නොතිබුණි. | අදාළ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | ගිණුම් කාරක සභා නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ඕ) | 2016 ජූනි සිට 2017 ජූනි 28 දක්වා කාලය තුළ ජල ගාස්තු අයකිරීමේදී ලැබීම් කුවිතාන්සිවල මුල් පිටපතේ සඳහන් මුදලට වඩා අඩු මුදලක් අනුපිටපතෙහි සඳහන් කර රු.2,625,660 ක් බැහැර කරගැනීම පිළිබඳව කටයුතු කිරීමේදී විනය කාර්ය සංග්‍රහයේ 23.7 ප්‍රකාරව කටයුතු කිරීම සඳහා විනය නියෝගය නිකුත් කර ඇති අතර, බැහැර කරන ලද මුදල රු.1,711,782 ක් ලෙස | විගණනය විසින් පෙන්වා දී ඇති වටිනාකමට අදාළ නඩු පවරා අයකරගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | දක්වා විනය නියෝග පැනවීම හේතුවෙන් රු.913,877 ක් සඳහා විනය නියෝග පනවා නොතිබුණි. | | |
| (ක) | 2011 වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරිපාලක විසින් සිදුකරන ලද මූල්‍යමය අලාභය රු.1,367,681 ක් ලෙස හඳුනාගෙන 2021 දෙසැම්බර් 27 දින විනය නියෝග පනවා තිබූ නමුත් 2024 මැයි වන විටත් ඊට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන වලද හෙළිදරව් කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |
| (ග) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 42 වන වගන්තිය ප්‍රකාරව විගණනය විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු හා වාර්තා වැඩ කරන දින 21 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් නොකිරීම වරදක් වන අතර විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කිරීම මාස 03 කට අධික කාලයක් ප්‍රමාද කර තිබුණි. | පිළිතුරු ලබා නොදුන් සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු සකස්කරමින් පවතින බව දන්වා ඇත. | විගණන විමසුම් සඳහා පිළිතුරු නියමිත පරිදි ලබාදිය යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ LDSP ව්‍යාපෘති අරමුදල් මඟින් අරලගංවිල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට පරිත්‍යාග කිරීම සඳහා මිලටගෙන තිබූ රු.253,750 ක් වටිනා ප්ලාස්ටික් පුටු අරලගංවිල ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් වර්ෂ 02 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය පුටු ලබාගැනීම ප්‍රතික්ෂේප කළ හෙයින් සභාවට අනුබද්ධ වෙනත් කාර්යාල සඳහා ලබාදීමට අවශ්‍ය කටයුතු කළ බව දන්වා ඇත. | අරමුදල් උපයෝජනය කිරීමට පෙර මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 ජූලි 11 දින රු.2,442,000 ක් වැය කර මිලටගත් වාහන සේදුම් ස්ථානයට අවශ්‍ය උපකරණ වලින් රු.1,280,000 ක් වටිනා උපකරණ මිලටගත් දින සිට මේ දක්වා නිෂ්කාර්යව පැවතුණි. | දැනට සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍රවල සේවා කටයුතු සිදුකිරීම සඳහා උපකරණ භාවිතා කරන බව දන්වා ඇත. | නිවැරදිව සැලසුම් සකස් කර ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ පෙර පාසලේ වැට ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට | ලියාපදිංචි සැපයුම්කරුවන් 06 න් මිල ගණන් කැඳවූ අතර, එක් අයෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කරන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ |

| | | | |
|---|---|---|---|
| | ගැනීමේදී හදිසි අවශ්‍යතාවයක් නොවන අවස්ථාවක ඇස්තමේන්තු මිළට වඩා රු.363,872 ක වටිනාකමකට සැපයුම්කරු තෝරා ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 ජේදයට පටහැනි විය. | ලදි. ප්‍රතිචාර දක්වා ඇති ප්‍රශස්ථ ලංසුකරු වන ආයතනය වෙත ලංසුව ප්‍රධානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලද බව දන්වා ඇත. | අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක බැංකු ආධාර ව්‍යාපෘති යටතේ ඉදිකරන ව්‍යාපෘති සඳහා ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු භාවිතා කිරීම නවතා තිබියදී ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු යොදාගෙන වහල සෙවිලි කිරීමට ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ඇති බවත් ඒ හේතුවෙන් එම වැඩ විෂයයන් කොන්ත්‍රාත් පිරිනැමීමෙන් පසු අත්හැර දමා ඒ වෙනුවට BS රේටයන්ට වැඩි රේටයකට අගය කරන ලද අතිරේක වැඩ විෂයයන් යටතේ වහල සෙවිලි කිරීමේ අයිතම ඉටුකර තිබුණි. මෙලෙස නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවී ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් වහලය සකස් කිරීමට රු.2,034,402 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි | මෙම ගොඩනැඟිල්ලේ වහලය දිගින් හා පළලින් අනෙක් ගොඩනැඟිලිවලට සාපේක්ෂව වැඩි පරායණයන් සහිත වීම හේතුවෙන් ලී යොදා සකස්කිරීම උචිත නොවීම හේතුවෙන් ඉංජිනේරුතුමාගේ උපදෙස් මත යකඩ, කාප්ප හා සී පර්ලින් යොදාගනිමින් වහලයේ රාමුව සකස්කළ අතර, අමානෝ සෙවිලි තහඩු යොදාගනිමින් සෙවිලි කිරීමට කටයුතු කළ බව දන්වා ඇත. | නිවැරදි සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ජේදය ප්‍රකාරව, විචලනයන්ගේ සාමාන්‍ය වටිනාකම හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන සීමාව ඉක්මවන්නේ නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මුලු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීමට පියවර ගත යුතු නමුත් පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මුලු පිරිවැය ඇස්තමේන්තුව රු.32,610,412 ක් වී තිබියදී, ශුද්ධ විචලනය රු.16,273,483 ක් එනම් මුලු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 50 ක් වී තිබුණ ද ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් අමුද්‍රව්‍ය, සේවා හා ප්‍රවාහන වියදම් ශීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් හා අදියර කීපයකින් නිමකළ යුතුව තිබූ වැඩ කොටස් එක් අදියරකදී නිමකිරීමට අනුමත කිරීමත් සමඟ ඇස්තමේන්තු වටිනාකම වැඩි වී ඇති බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ PT-02 යටතේ පෙර පාසලේ GI වැට ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීමේ ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික නිලධාරි විසින් රු.2,691,300 ක ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර, එම ඇස්තමේන්තුව පිළියෙල කළ දිනයක් හෝ පරික්ෂා කළ දිනයන් සඳහන් නොවුන අතර, භාවිත කළ BSR රේටයන් අදාළ කරගත් කාලපරිච්ඡේදය දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුලු පිරිවැය ඇස්තමේන්තුව සියලු විස්තර සහිතව පිළියෙල කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු අනුව අනුමත කාර්ය මණ්ඩලය 71 ක් වූ අතර, ඉන් 14 ක් පුරප්පාඩු ලෙස පැවතුණි. | අදාළ ආයතන දැනුවත් කර ඇති බව දන්වා ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට වගකිව යුතු අංශ දැනුවත් කළ යුතුය. |
| (ආ) | 2010 වර්ෂයේ සිට අයවිය යුතුව පවතින රු.144,058 ක් වූ ණයශේෂ 07 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ණය ශේෂයන් කඩිනමින් නිරවුල් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | නියමිත පරිදි පැවැත්වීම සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වා ඇත. | විගණන කළමනාකරණ කමිටු නියමිත පරිදි පැවැත්විය යුතුය. |

## 4.2 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ පාරිසරික බලපත්‍ර කල් ඉකුත් වූ බලපත්‍ර ලාභීන් 15 දෙනෙකු නැවත එම බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | කර්මාන්තකරුවන් බොහොමයක් පරිසර බලපත්‍ර ලබාගැනීමට යොමුවී ඇති බවත් අවසන් සිහි කැඳවීම් සඳහා ප්‍රතිචාර නොදක්වන කරුමාන්තකරුවන්ට නීතිමය කටයුතු කරන බවත් දන්වා ඇත. | ජාතික පාරිසරික පනත ප්‍රකාරව පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු නියාමනය කළ යුතුය. |